# සංවර්ධන සංකල්පය අර්ථ දැක්වීමෙහි ලා බෞද්ධ දාර්ශනික චින්තනය පදනම් කොටගත් අදහස් සමුදායක්

ආචාර්ය සේන නානායක්කාර

"සංවර්ධනය" යන්න පිළිබඳ ශාස්ත්‍රීය ප්‍රතිෂ්ඨාවෙහි සිට කරුණු විමර්ශනය කිරීමේ දී විවිධ විෂය ක්ෂේත්‍රයන් හා විවිධ දෘෂ්ටිකෝණයන් ද ගණනාවක් වෙයි. ඒ ඒ විෂය ක්ෂේත්‍රයනට අදාළ ව ගොඩනැගෙන දෘෂ්ටිමය න්‍යායයන් විවිධාකාර යි. ඒ අතර ඒ කෙරෙහි ලා විමර්ශනාත්මක ව එල්ල කෙරෙන ආගමික දෘෂ්ටීන් අද්‍යතන පර්යේෂකයින්ගේ දැඩි අවධානය දිනාගනිමින් තිබීම විශේෂත්වය කි. බුද්ධ දේශිතය ඇසුරෙන් කෙරුණු හා කෙරන අධ්‍යයනයන් ඒ අතර ප්‍රමුඛස්ථානයෙහි වෙයි. [1]

"සංවර්ධනය" යනු කුමක්දැ යි සපුරා විමසීමෙහි ලා වන වඩා ත් යෝග්‍යතර දෘෂ්ටිපථය "බෞද්ධ දර්ශනය" යැයි උක්ත පර්යේෂකයින්ගෙන් සමහරෙක් මේ වන විට ත් සිය පර්යේෂණයන් තුළින් ස්ඵුට කරමින් සිටිති. ඒ අනුව, චිරාත් කාලයක් තුළ පැවති සාම්ප්‍රදායික ආර්ථික මූලධර්මයන්ගේ ශක්‍යතා පරිමාණයන් ප්‍රබල ලෙස අභියෝගයට ලක් කරමින් "සංවර්ධනය" පිළිබඳ බෞද්ධ චින්තනය පතළ වෙමින් පවතින බව පෙනේ. අදාළ විග්‍රහයට ප්‍රථම එකී නිර්වචනයන් කරණකොට ගෙන ඊට එරෙහි ව නැගෙන පරස්පරයන් ද පළමුවෙන් හඳුන්වා දිය යුතු ව ඇත. විෂය මූලික ගැටලුවට විසඳුම් සෙවිය හැකි වඩා ත් ශාස්ත්‍රීය වූ ක්‍රමවේදය එය වන බැවිනි.

නිර්වාණය නිෂ්ඨාව කොටගත්, ලෞකිකත්වය ඉක්මවා යන චර්යාධර්ම පද්ධතියක් තුළ ආර්ථික දර්ශනයක් අන්තර්ගත විය හැකි ද? යන්න මේ පිළිබඳ ව පැනනැගෙන ප්‍රකට මතය කි. [2] එ පමණක් ද නොව, "ආත්මය මහා අනර්ථකාරී මූලාවක් ලෙස දකින දහමක් තුළ" සමාජ සංවර්ධනයන් මත රැඳෙන වගකීමක් පිළිබඳ හැඟීමක් කෙසේ නම් තිබිය හැකි ද"? [3] යන්න ද ඒ අතර ප්‍රධාන වෙයි.

නමුත්, ඒවා බුදුදහම අර්ථ සම්පන්න ව අධ්‍යයනය නො කිරීමෙන් පැන නැගෙන ගැටලු බව තවත් අය හඳුන්වති. [4] එ මෙන් ම, මුල් බුදුසමයෙන් ඉගැන්වෙන මූලික පෙළ දහම් පිරිසිඳ නො දැන ගොඩනගාගත් සංකීර්ණතා ලෙස ද ඒවා හැඳින්විය හැකි ය. [5]

"සංවර්ධනය" යනු භෞතික සහ ආධ්‍යාත්මික අංශද්වයේ ම දැක්වෙන වෘද්ධියක් බව [6] (අංගුත්තර නිකාය) බුද්ධ දේශිතයෙහි පෙළ දහම පෙන්වා දෙයි. "වෘද්ධිය" යන්න එහි දැඩි ව අවධාරණය කෙරේ. බුදුන්වහන්සේ එ බඳු වෘද්ධීන් දහයක් හඳුන්වා දෙති.

| | | | |
|---|---|---|---|
| 1. | කෙත් වතු | 6. | ශ්‍රද්ධා |
| 2. | ධන ධාන්‍ය | 7. | ශීල |
| 3. | අඹු දරු | 8. | ශ්‍රැත |
| 4. | දස් කම්කරු | 9. | ත්‍යාග |
| 5. | සිවු පා | 10. | ප්‍රඥා |

යනුවෙන් ඒවා කොටස් කෙරේ.

> "දසහි භික්ඛවේ වඩ්ඪීහි වඩ්ඪමානො අරියසාවකො අරියාය වඩ්ඪියා වඩ්ඪති, සාරාදායී ච හොති වරාදායී කායස්ස කතමෙහි දසහි ඛෙත්තවත්ථූහි වඩ්ඪති............ ධනධඤ්ඤෙන........ පුත්තදාරහි ....... දාසකම්මකරපොරිසෙහි......... චතුප්පදෙහි......... සද්ධාය...... සීලෙන....... සුතෙන....... චාගෙන....... පඤ්ඤාය වඩ්ඪති ඉමා හි ඛො භික්ඛවෙ දසහි වඩ්ඪීහි වඩ්ඪමානො අරියසාවකො අරියාය වඩ්ඪීති, සාරදායී ච හොති වරාදා යි කායස්ස" [7]

මෙහි "උභයෙන වඩ්ඪති" යන්නෙන් භෞතික හා ආධ්‍යාත්මික යන උභයාංශයේ ම වර්ධනය අපේක්ෂා කරන බව ඇඟවේ. ප්‍රථම පංච වර්ධනාංශයෝ භෞතිකය එසේ ත් නැත්නම් ලෞකිකත්වය කෙරෙහි ද, පශ්චිම පංච වර්ධනාංශයෝ ආධ්‍යාත්මික එසේ ත් නැත්නම් පාරලෞකිකත්වය කෙරෙහි ද අරමුණු කෙරෙන බව එයින් කියැවේ.

> "උක්ත "උභයාංශ වෘද්ධිය" හෙවත් උබයාර්ථ සංකල්පය (උභයත්ථ සංකප්ප) එක ම ස්ථිරසාර අර්ථ නිරූපණයක් ලෙස බුද්ධ දේශිතය තුළ පෙළ ගැස්වෙයි. "උභයාර්ථය" නම්

ලෞකික හා ලෝකෝත්තර අර්ථය යි. ලෞකික අර්ථය ද ඉහලෝක හා පරලෝක යන දෙක ම ඇතුළත් කරගනියි. එමෙන් ම ආත්මාර්ථය හා පරාර්ථය ද එහි ගම්‍ය ය. එහෙයින්, මෙලොව අභිවෘද්ධිය පරදුවට තබා පරලොව හෝ ලෝකෝත්තර දියුණුවට ක්‍රියාකරන න්‍යාය ධර්මයක් බුදු දහමින් අවධාරණය කර නැත.'' [8]

මිනිසාගේ දියුණුව, එසේ ත් නැත්නම් ''සංවර්ධනය යනු උක්ත උභයත්‍ර චින්තාවෙහි සරු ඵලය බව'' සිඟාලෝවාද සූත්‍රයෙහි ද විග්‍රහ කෙරේ. දෙලොව ම සැප වනු පිණිස මිනිස් ජීවිතය පුරා ගොඩනගා ගත යුතු චර්යා රටාව මේ මගින් තීරණය කෙරෙනු ඇතැයි හැඟේ.

''ආර්ය ශ්‍රාවකයා සතර කම් කිලෙස් ප්‍රහීණ කොට, අගති සතරෙන් ඈත් ව භෝග විනාශ දොරටු සය නො සොයා මෙසේ තුදුස් ලාමක කම්වලින් බැහැර ව සදිසා වසාලන්නේ උභය ලෝක විජය සඳහා පිළිපන්නේ වෙයි.'' [9]

අංගුත්තර නිකායේ පුග්ගල වග්ගයෙහි අඩංගු අන්ධ (ද්විචක්ඛු) සූත්‍රය ද ඊට මනා සාක්ෂි සපයයි.

''මිනිසාට තිබිය යුතු ඇස් දෙක කි. එනම්, නො ලත් බෝග ලබාගැනීමට ත්, ලද භෝග වැඩි දියුණු කර ගැනීමට ත් දැනගැනීම පළමුවැන්න යි. දෙවැන්න, කුසලාකුසල, සාවද්‍ය නවද්‍ය ධර්ම, හීන ප්‍රහීණ ධර්ම, කෘෂ්ණ ශුක්ල ධර්ම දැනගැනීම යි.[10]

දීඝජානු කෝලිය පුත්‍රයා කෙරෙන් බුදුජාණන්වහන්සේ විසින් දේශිත ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි හරය විමසීමේදී ද අප සිහි කැඳවන්නේ මෙ බඳු ම න්‍යාය ධර්මයකට යි. මෙලොව හිතසුව පිණිස හේතුවන චර්යා ධර්ම හතරක් හා පරලොව හිතසුව පිණිස හේතුවන චර්යා ධර්ම හතරක් මෙහි දී බුදුහු වදාළ හ. මෙලොව හිතසුව පිණිස ඉවහල් වනුයේ,

1. උත්සාහ සම්පත්තිය (උට්ඨාන සම්පදා)
2. ආරක්ෂා සම්පත්තිය (ආරක්ඛ සම්පදා)
3. කලණ මිතුරු ඇසුර (කල්‍යාණ මිත්තතා)
4. සම සේ දිවිපැවැත්ම (සමජීවිකතා)

යන චර්යා ධර්මයන් ය. පරලොව හිතසුව පිණිස ඉවහල් වනුයේ, පහත දැක්වෙන චර්යා ධර්මයන් වෙයි.

1. ශ්‍රද්ධා සම්පත්තිය (සද්ධා සම්පදා)
2. ශීල සම්පත්තිය (සීල සම්පදා)
3. ත්‍යාග සම්පත්තිය (චාග සම්පදා)
4. ප්‍රඥා සම්පත්තිය (පඤ්ඤා සම්පදා)[11]

මෙහි මෙලොව හිත සුව පිණිස යන්නෙන් අර්ථකථනය වන්නේ මිනිස් සමාජය තුළ සපුරා පසක් කරගත යුතු ආර්ථික දියුණුව යි. උත්සාහ, ආරක්ෂා හා සමජීවිකතා සම්පත්තීන් තුළින් ආර්ථිකය අරමුණු කෙරෙන අතර, වඩාත් සුදුසු සමාජ සම්බන්ධතා ගොඩනැගීම පිළිබඳ ව "කල්‍යාණ මිත්තතා" යනුවෙන් අරුත් ගැන්වෙයි. උත්සාහයෙන් භෝග රැස්කිරීම ත්, එසේ රැස්කරගත් දේ යහමින් ආරක්ෂා කොට ගනිමින් ම සම සේ භුක්ති විඳීම ත්, එ මෙන් ම යහපත් සමාජ සම්බන්ධතාවන් ද ඉන් හෙළිදරව් කෙරේ. එ පමණක් නොව, ශ්‍රද්ධා, ශීල, ත්‍යාග හා ප්‍රඥා සම්පත්තීන් ඇසුරින් ආධ්‍යාත්මික පාරිශුද්ධිය ගොඩනැගෙන අයුරු ද ඉන් කුළුගැන්වෙයි.

ආර්ථික සමෘද්ධිය මෙහි ප්‍රමුඛත්වයෙහි පවතින බවක් පෙනේ. එනම්, ආධ්‍යාත්මික සංවර්ධනය නැමති උපරි ව්‍යුහය රඳා සිටින පදනම වශයෙන් ආර්ථිකය විස්තර කෙරෙන බැවිනි. "භෝග රැස් කිරීමෙන් යහමින් ගිහිගෙයි විසිය හැකි" බව බුදුන් වහන්සේ වදාළ සේක.[12]

කාමභෝගි ගිහියාට ආර්ථික ශක්තිය ගොඩනගා ගැනීමේ අත්‍යවශ්‍ය බව ඍජු ලෙස ම පැහැදිලි කෙරෙන්න කි ඡක්ක නිපාතයේ එන ඉණ සූත්‍රය. යහපත් ආර්ථික පසුබිමක් නැති කාමභෝගී ගිහියාට දුකක් මිස සැපයක් භුක්ති විඳිය නො හැකි බව ඉන් කියවේ. "දිළිඳුකම යනු දුකක්" ලෙස එහි අවධාරණය කෙරේ. "දාළිද්දියං භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං කාම භොගිනො[13] හැකි කල හෝගා දී ධන ධාන්‍යයන් රැස් කළ යුතු බව බුදුහු දේශනා කළෝ එ බැවිනි.

"අචාරිත්වා බ්‍රහ්ම චරියං අලද්ධා යොබ්බනෙ ධනං
පිණ්නකොංචාව කධායන්ති ඛීණමච්ඡෙව පල්ලලෙ" [14]

"තරුණ කල එසේ ධනය රැස් නො කරන්නහු, පසු කල මසුන් නැති දියසුන් විලක මඩ පිට තැවෙන මහළු කොස් ළිහිණින් මෙන් අකාලයේ තැවෙති" යි යන්න එහි සුචනාර්ථය යි. ආර්ථික ශක්තියක් නොමැති කල වෙසෙසින් පුහුදුන් ජීවිතයට එක්වන්නේ දුක කි. මුල් බුදු සමයේ පෙළ දහම විසින් ප්‍රකාශිත සැපය පිළිබඳ සංකල්පය ද මේ සමග බැඳෙන ඉගැන්වීම කි. බුද්ධහම තුළ

ප්‍රකට අනණ සූත්‍රය මගින් කාමභෝගී මිනිසා විසින් ලබාගත යුතු සැප හතරක් පිළිබඳ පැහැදිලි කරයි. එනම්, දැහැමින් ධන ධාන්‍ය ඉපැයීමෙන් ලබන සැපය අත්ථි සුඛය ලෙස ද, එකී භෝගාදී ධන ධාන්‍ය යථාවත් පරිදි පරිභෝජනය කිරීම භෝග සුඛය ලෙස ද, කිසිවකුට ණයක් බරක් නොවී ජීවිකාව පවත්වා ගැනීම අනණ සුඛය ලෙස ද, අවසන් වශයෙන් අධ්‍යාත්ම දියුණුවට මග කියාපාන චිත්ත දමනයෙන් ලබන සැපය අනවජ්ජ සුඛය වශයෙන් ද එයින් කියැවේ.[15]

පන්සිය පනස් ජාතකයේ එන "කුලාවක ජාතකය" ද සමාජ සංවර්ධනය පිළිබඳ නිවැරදි බෞද්ධාගමික දෘෂ්ටිය හෙළිදරව් කරයි. යටගිය දවස රජගහනුවර මගධ රජු පුත් "මඝ" කුමාරයෝ සිය "මචල" නම් වූ ග්‍රාමය සංවර්ධනය කරන අයුරු[16] නිදසුන් ය. පත්තකම්ම සූත්‍රයෙන් කුළුගැන්වූයේ හුදෙක් භෝග ඉපැයීම ම ගැන පමණක් නොව, එය දැහැමින් ඉපැයීම ගැන යි. "භෝග උප්පජ්ජන්තු සහධම්මෙන"[17]

බෞද්ධ චින්තනයට අනුව මිනිස් සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් වන භෞතික සහ ආගමික ආධ්‍යාත්මික යන ද්විපාර්ශ්වය කෙරෙන් ප්‍රකට කළ යුතු වෘද්ධිය මේ සියලු කරුණු වලින් අවධාරණය වෙයි. "මසුරු ලෙස ගොඩගසා ගැනීම නිසා ත්, අනිසි ලෙස වියදම් කිරීම නිසා ත්, ස්වාභාවික සම්පත් සූරාකෑම නිසා ත්, අතෘප්තිකර ඉන්ද්‍රිය ප්‍රිණනය නිසා ත් විපතට පත් ව සිටින අද්‍යතන සමාජයට එකම පිළිසරණ බෞද්ධ ආර්ථික දර්ශනය" බව අද බොහෝ දෙනා පිළිගනිති.[18]

ඒ අනෙකක් නිසා නොව, මිනිස් සමාජයේ දියුණුව හෙවත් සැබෑ සමාජ සංවර්ධනය එයින් අර්ථ නිරූපණය කරන බැවිනි.

> "මනුෂ්‍ය වර්ගයා මෙතෙක් හරිහැටි අවබෝධ කරගෙන ක්‍රියාවට නංවා නැති වැදගත් කරුණු දෙකක් බුදුහිමියන් විසින් ඉදිරිපත් කරනු ලැබ තිබේ. පළමුවැන්න, මනුෂ්‍යයාගේ සතුට ලබාගත හැක්කේ ආධ්‍යාත්මික සමෘද්ධියෙන් පමණක් හෝ භෞතික සංවර්ධනයෙන් පමණක් හෝ නො වන බව යි. මේ අංශ දෙක ගැනම සමාන අවධාරණයක් මිනිසා සතුටට පත් කිරීම සඳහා අවශ්‍ය ය. මේ තර්කයෙහි වලංගුභාවය කිසිදුසැකයකින් තොර ව අපේ යුගය ඔප්පු කර සිටියි. වර්තමාන ලෝකයේ ආර්ථික සමෘද්ධිය ලබා ඇති කොටස ආධ්‍යාත්මික හරයන් සම්පූර්ණයෙන් ම පාහේ නො සලකා හැර ඇත. ලෝක ජනතාවගෙන් ඉතිරි කොටස සාම්ප්‍රදායික ආධ්‍යාත්මික හරයන් කෙරෙහි භක්තිමත් ව සිටිය ත්, බොහෝ සෙයින් තම පාලනයෙන් බැහැර වූ හේතුන්

නිසා, ජීවිතයේ භෞතික අංශය නො සලකා හැර ඇත. ප්‍රතිඵලය වී ඇත්තේ කුමක් ද? පෝසතුන් මෙන් ම දූප්පතුන් ද අසන්තුෂ්ටියෙන් ජීවත්වීම යි.” [19]

සංවර්ධනය යනු, හුදෙක් භෞතික දියුණුව ම පමණක් හෝ ආධ්‍යාත්මික දියුණුව ම පමණක් නොවන බව ත්, එය එකී උභයාංශයේ ම මුහුවක් බව ත් මේ අනුව කියැවේ. බුදුන් වහන්සේ විසින් තමන් වහන්සේ හාත්පස වූ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා ඈ සිව්වනක් පිරිස වෙත වදාරන ලද ද්විචක්ඛු, වඩ්ඩි, මහා චත්තාරිසක, ධම්මචක්ක පවත්තන, චක්කවත්ති සීහනාද, කූටදන්ත, අග්ගඤ්ඤ, සිඟාලෝවාද, උජ්ජය, අරියවංශ, අනණ, පත්තකම්ම, ඉණ, ව්‍යග්ඝපජ්ජ ආදී සූත්‍ර දේශනාවෝ ඒ අතර ප්‍රමුඛස්ථානයෙහි වෙති. ධම්මපදය, ත්‍රිලක්ෂණය, කර්මය, පුනර්භවය, මධ්‍යම පටිපදාව හා පටිච්ච සමුප්පාදය වැනි මූලික ඉගැන්වීම් සියල්ල තුළ වුව විද්‍යමාන සාරාර්ථය ද එය ම ය.

උක්ත කාරණා සියල්ල අධ්‍යයනය කිරීමේදී අප විසින් ප්‍රස්තුත කොටගන්නා ලද “සංවර්ධනය” යන්න සඳහා වන බෞද්ධාගමික දෘෂ්ටිය සුපැහැදිලි ය. “එය ‘ආර්ථිකය පදනම් කොටගත් එමෙන් ම ආධ්‍යාත්මික හැඩගැස්මෙන් යුතු වෘද්ධියමය ස්වභාවය කි.”

## සටහන්;


1. E.F. Schumacher, Small is beautiful, ABACUS edition, 1974.
2. Max Weber, The Sociology of Religion, London, 1996 (First published in Germany, 1922) The religion of India, The Sociology of Hindusm and Buddhism, The Free Press, Gilencoe, IIIinoise, 1958.
3. Max Weber, Religion of India, 1958, p.213. (How is a sense of social responsibility resting on social development possible within a frame work a doctrine which considers the ego as a grand and pernicious basic illusion?”
4. ඔලිවර් අබේනායක, මුල් බුදුසමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය (හැඳින්වීම) අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ, 1994.
5. ඔලිවර් අබේනායක, එම
6. අංගුත්තර නිකාය, 6, 244, වඩ්ඩි සූත්ත

7. අංගුත්තර නිකාය, 6, 244, වඩ්ඪි සුත්ත
8. කාක්කපල්ලියේ අනුරුද්ධ හිමි, (1986 මැයි 23 වෙනිදා සෝවියට් රුසියාවේ මොස්කව් නුවරදී පැවැත්වූ දේශනයක් ඇසුරෙනි) සිංහල පරිවර්තනය ආචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර, ශ්‍රී චන්ද්‍රමුනි ආශිර්ලේඛා, 1986 පිටුව 26

9. දීඝ නිකාය, 3, 29, සිගාලක සුත්ත,
"යතො ඛො ගහපතිපුත්ත අරියස්ස සාවකා චත්තාරො
කම්ම කිලෙසා පහීණා හොන්ති, චතුහි ඨානෙහි පාපකම්මං න කරොති, ඡව භොගානං අපාය මුඛානි න සෙවති, සො එවං චුද්දස පාපකාපගතො, ඡද්දියා පටිච්ඡාදි උභයලොක විජයාය පටිපන්නො හොති"

10. අංගුත්තර නිකාය, 1., 238, අන්ධ (ද්විචක්ඛු) සුත්ත. "අන්ධං ච චක්ඛුං ච ආරකා පරිමජ්ජයෙ ද්වි චක්ඛුං සෙවෙථ සෙට්ඨං පුරිසපුග්ගලන්ති."

11. අංගුත්තර නිකාය, 5. , 234 පිට, ව්‍යග්ඝපජ්ජ සුත්ත.

12. දීඝනිකාය, 3., සිඟාලක සුත්ත, 303 පිටුව (එවං භොගෙ සමාහත්වා අලමත්තො කුලෙ ගිහි)

13. අංගුත්තර නිකාය, 4., 118 - 122, ඉණ සුත්ත

14. ධම්ම පදය, ජරාවග්ගය, 155 ගාථාව.

15. අංගුත්තර නිකාය, 2., 130, අනණ සුත්ත"චත්තාරිමානි ගහපති සුඛානි අධිගමනීයානි ගිහිනා කාමභොගිනා කාලෙන කාලං සමයෙන සමයං උපාදාය කතමානි චත්තාරි , අත්‍ථි සුඛං, භොග සුඛං, අනණ සුඛං, අනවජ්ජ සුඛං"

16. වැඩිදුර කියවීම සඳහා, පන්සිය පනස් ජාතකය, 1 කාණ්ඩය, 31 කුලාවක ජාතකය.

17. අංගුත්තර නිකාය, 2., 124, පත්තකම්ම සුත්ත.

18. ඔලිවර් අබේනායක, මුල් බුදුසමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය, ධර්මසේන හෙට්ටිආරච්චි (හැඳින්වීම)

19. Piyasena Dissanayake, "A Buddhist perspective to socio-ecnomic problems of society with special reference to Asia" in Logos vol'24, No.4,p.7.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**ආචාර්ය සේන නානායක්කාර**
B.A. ( Hons.), M.A.( Research Mass Comm:)
Ph.D. ( Mass Communication)
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.